# 2018.09.18 වන දින යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවති හයවන සැසි වාරයේ සිව් වන මහා සභා රැස්වීම් වාර්තාව

ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව වේලාව - පෙරවරු 9.00

2018.09.18 වන දින පැවති ගරු මහා සභා රැස්වීම සදහා සහභාගි වූ ගරු මන්ත්‍රිතුමන්ලාගේ නාම ලේඛනය

1.ගරු සභාපතිතුමා - කේ.ඩි.වසන්ත මහතා
2.ගරු උපසභාපතිතුමා - ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා
3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.එම්.සත්‍යානන්දන් මහතා
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා
5ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මහතා
6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා
7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ඩබ්ලිව්.කතිකා දමයන්ති මහත්මිය
8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි -කේ.කේ.නිමල් විජේසූරිය මහතා
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එන්.කේ.නිමල් කුමාරසිරි මහතා
10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඒ.ජී.තිලකරත්න මහතා
11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩි.ඒ.එල්.සුනිල් දෙයියාගල මහතා
12.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි - පි.ඩබ්ලිව්.අමිල හේමන්ත විජයසිරි මහතා
13ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එම්.ඩබ්ලිව්.හිමන්ත අජිත් බණ්ඩාර මහතා
14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මහතා
15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ඩි.පි.ප්‍රේමසිරි ජයලත් මහතා
16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ජී.ආර්.ලාල් නිශාන්ත මහතා
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි -ඩබි.ජී.සරත් ප්‍රේමසිරි මහතා
18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එස්.සුදර්ශන් මහතා
19.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - ටි.පි.ජී.ඩබිලිව්.කිර්තිසේන අල්විස් මහතා
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා කුමාරි මෙනවිය
21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි -එම්.ඩි.පි.ඥානවති මහත්මිය
22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ටි.ඉමල්කා සංජිවනි මහත්මිය
23.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - බි.ජී.සීතා රංජනි මහත්මිය
24.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි -ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය
25ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි -එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා
26.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - කේ.කමල්රාජ් මහතා

## 2018.09.18 වන දින පැවති ගරු මහා සභා රැස්වීම සදහා සහභාගි වූ නිළධාරින්

1.ලේකම් - ආර්.එම්.ඒ.රත්නායක මහත්මිය
2.සංවර්ධන නිළධාරි - ආර්.එච්.සි.නිසාන්ති මහත්මිය

## සභා ගර්භයෙන් පිටව ගිය ගරු මන්ත්‍රිතුමන්ලාගේ නාම ලේඛණය

1ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.කේ.කේ.සංජිව අබේකෝන් මහතා ප.ව.1.00 ට පමණ
2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.ඒ.ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා ප.ව.1.45 ට පමණ

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව පැමිණ සිටි සියළුදෙනා ආගම සිහිකිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත්ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙ.ව.9.00 ට පමණ ආරම්භ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

අද දින පැවැත්වෙන මහා සභා රැස්වීම සදහා සහභාගි වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළුගරුමන්ත්‍රි තුමන්ලා හා ගරු මන්ත්‍රි තුමියන්ලා ආදරයෙන් ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයත් ,මාධ්‍යආවරණය සදහා පැමිණි මාධ්‍ය නියෝජිත තුමන්ලාත් මා ආදරයෙන් ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.අද දින පැවැත්වෙන ගරු මහා සභා රැස්වීමට අදාළ සියළුම ඉදිරි කටයුතු සාර්ථකව ඉටුකර ගැනිම සදහා ඔබ සැමගේ සක්‍රිය දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරනු ලබනවා.

## *අ.පසුගිය මහා සභාවේ රුැස්විම් වාර්තාව සභා සම්මත කිරිම*

**ගරුසභාපතිතුමා**

2018.08.17 වන දින පැවති මහා සභා රැස්විම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සළකා එහි කිසියම් නිවරදි කිරිම් හෝ සංශෝධන නොමැතිනම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් මා මෙම සභාවට දන්වා සිටිනවා..

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටි.පි.ජි.ඩබ්ලිව්.කිර්තිසේන අල්විස් මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලද 2018.08.17 වන දින පැවති මහා සභා රුැස්විම් වාර්තාව නිවරදි බවත් සභා සම්මත කිරිම සුදුසු බවත් මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එන්.කේ.නිමල් කුමාරසිරි මහතා**
ගරු සභාපතිතුමනි, ඒයෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විරුද්ධත්වයක් ඇත්නම් ප්‍රකාශ කරන ලෙස දන්වා සිටින ලදි.

නිහඩතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.

නිවැරදි කිරිම් හෝ විරෝධතා රහිතව 2018.08.17 වන දින පැවති මහා සභා රැස්විම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු මහා සභාවට නිවේදනය කරනවා.

*ආ.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදනය -*

1.ගිවිසුම් කඩ කිරිම හේතුවෙන් කඩ කාමර ආපසු පවරා ගැනිම සම්බන්ධයෙන් ආණ්ඩුකාරවර ලේකම් විසින් 2018.8.30 වන දින ලිපියක් මගින් එවා ඇත.එමගින් දන්වා ඇත්තේ යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් පොදු වෙළදපල කඩ කාමරවලට අදාල බදු ගිවිසුම් අත්සන් කිරිම සදහා සහ

ගිවිසුමේ කොන්දේසි උල්ලංඝණය කරන බදු කරුවන් සඳහා ප්‍රාදේශිය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරිම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා දි ඇති බව දන්වා එවා ඇත.

(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම-

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.ඩබ්.එච්.ඒ.බණ්ඩාර මහතා විසින් 2018.09.11 දිනැති ලිපිය මගින් එවන ලද සිපෝත් කොට්ඨාශයේ නාගස්තැන්න වසමේ ඇති රාජ්‍ය ගොඩනැගිල්ලේ පැන නැගි ඇති ගැටළුව සම්බන්ධව දන්වා ඇති ලිපිය ගරු මහ සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරමි.

(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ- නැත

(ඉ) යථා පරිදි කල් දි ඇති යෝජනා

**ගරු සභාපතිතුමා**

(ඉ) 01. 2019 වර්ෂය සදහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරිම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 3:4:3 වගන්තිය යටතේ වාර්ෂික සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ යුතුව ඇත.පසුගිය වසරෙහි එක් එක් භාණ්ඩ සැපයීම හා සේවාවන් සදහා කොන්ත්‍රාත් සදහා ලියාපදිංචි වීමට අයකළ මුදල(වැට් සමග) පහත පරිදි වේ.

01.භාණ්ඩ සැපයීම හා සේවාවන් සදහා - රු. 1000.00

02.කොන්ත්‍රාත් සදහා

(a)රු . 100 000.00 දක්වා -රු .1000.00 (b)රු .100 000/=රු.200 000/=දක්වා-රු .1450.00

(c)රු .200 000/=300 000/=දක්වා රු.2400.00(d)රු.300000/=400000/=දක්වාරු.2850.00

(e)400 000/=-500 000/=දක්වා -රු .3800.00 ( f) 500 000 කට වැඩි වටිනාකම සදහා රු.4200.00

ඒ අනුව 2019 වර්ෂය සදහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේදී ඉහත ගාස්තු ප්‍රමාණයටම අය කරන්නේද නැතහොත් ගාස්තු සංශෝධනයක් සිදු කරන්නේද යන්න පිළිබදව තීරණය කිරීම සදහා පුවත්පත් දැන්වීම් පල කිරීමේදි සිංහල ,දෙමළ හා ඉංග්‍රිසි යන භාෂා තුනෙන්ම පල කිරීමටත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සදහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සදහා මා යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජී.ආර්.ලාල් නිශාන්ත මහතා**

ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.අංක 02 යටතේ කොන්ත්‍රාත් කරුවන් සඳහා දි ඇති මිල ගණන් සඳහා 50% ක් වැඩි කරගැන්මට සුදුසු බව මා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ජී.තිලකරත්න මහතා**

ගරු සභාපතිතුමනි,මාත් ඒ අදහසට එකඟ වෙනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා**

ගරු සභාපතිතුමනි,කොන්ත්‍රාත්කරුවන් සඳහා 50% කින් වැඩි කිරීමට සුදුසු යැයි මා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මහතා**

ගරු සභාපතිතුමනි ,කොන්ත්‍රාත්කරුවන් සඳහා 50% කින් වැඩි කිරීමටත් භාෂා තුනෙන්ම පුවත්පත් දැන්වීම් පළ කිරීමටත් සුදුසු යැයි මා ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**

අංක 02 යටතේ සඳහන් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේ දි දන්වා ඇති මිලගණන්වලට 50%ක් දක්වා වැඩි කිරීමටත් භාෂා තුනෙන්ම පුවත් පත් දැන්වීම් පළ කිරීමත් සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 01**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 02. අමනාවල මහජන පුස්තකාලය සඳහා සිරිකත හා දියණිය සගරා මිලදී ගැනීමට හා කිතුල්ගල මහජන පුස්තකාලයට ලක්බිම හා රිවිර දිනපතා පුවත්පත් ලබා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය**

ගරු සභාපතිතුමනි,මා ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 02**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 3. යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් නවට පෙර පාසලේ දරුවන් 35 දෙනෙකු සඳහා ජූලි මස සිට මාසිකව 2018 වර්ෂය සඳහා චූටි බබා පුවත් පත් 35 බැගින් මිලදී ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා**

ගරු සභාපතිතුමනි,මා ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 03**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 4.. කාර්යාලය,කලටුවාව කාබනික පොහොර මධ්‍යස්ථානයට,කිතුල්ගල,අමනාවල පුස්තකාලය සදහා පැමිණීම පිටවීම සටහන් කිරිමට ඇගිලි සළකුණු යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්ලිව්.එම්.පි.ඩයනා උදයංගනි මෙනවිය**

ගරු සභාපතිතුමනි,මා ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 04**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 5.පහත සදහන් පොත් මහජන පුස්තකාල සදහා මිලදි ගැනීමට පුස්තකාල උපදේශන කමිටුවේ නිර්දේශය ලැබී ඇති බැවින් එම පොත් මිලදි ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා..(පිටපත් 03 බැගින් මිලදී ගැනීමට නිර්දේශ විය)

| | පොතේ නම | මිල | පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | කෛලාශ බවන | 490.00 | 03 |
| 2. | නියමාරියා | 500.00 | 03 |
| 3. | ඇනී ලොරී | 300.00 | 03 |
| 4. | මොනවා වරදින්නද | 350.00 | 03 |
| 5. | සාමාහිත වැව | 1000.00 | 03 |

6. නොනිමි විප්ලවය 275.00 03
7. රන්මුසු අශනිය 475.00 03
8. සකුරාගේ ජපන් රහස 195.00 03
9. මැල්ලුම් වත්ත 200.00 03

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මහතා**

ගරු සභාපතිතුමනි,එම පොත් මිලදී ගැනිමටත් ගෙවීම් කිරීමටත් සුදුසු යැයි එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත සඳහන් කර ඇති පොත් මිලදී ගැනිමටත් ගෙවීම් කිරීමත් සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 05**)

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා ඔබගේ යෝජනාව මේ මහ සභාව වෙත ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා**

(ඉ) 6. අපට ලබා දි ඇකති වීදි ලාම්පු කිසිම ප්‍රමිතියක් නෑ.උදේට බල්බ් එක දාලා හවස් වන විට පිච්චෙනවා.අද මන්ත්‍රීවරු 28 දෙනාටම තිබෙන ගැටළුවක් මේක.ටෙණ්ඩර් මණ්ඩලයට දාලා ප්‍රමිතිය බලලා තත්වයෙන් උසස් වගකිමක් සහිත තැනකින් මේ බල්බ් ටික ගන්න.

**ගරු උප සභාපතිතුමා**

ගරු සභාපතිතුමනි,බල්බ් මිලදී ගැනිමේ දි හොඳ ප්‍රමිතියකින් යුක්ත බල්බ් මිලදී ගැනිමට කටයුතු සිදු කරමු.

**ගරු සභාපතිතුමා**

නැවත බල්බ් මිලදී ගැනිමේ දි ප්‍රමිති සහතිකය හා එහි වගකිම් කාලය බලා ටෙණ්ඩර් මණ්ඩලය නිර්දේශය අනුව ලබා ගැනිමට මින් ඉදිරියට කටයුතු සිදු කරන බව මේ මහ සභාවට දැනුම් දෙන් ලබනවා.

(**සභා තීරණ අංක 06)**

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මහතා ඔබගේ යෝජනාව මේ මහ ගරු සභාව වෙත ඉදිරි පත් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මහතා**

(ඉ)7. අප ප්‍රාදේශිය සභාවට අයත් හොරන්දල පිහිටි නිවාස වලට පිවිසිම සඳහා ජයමාන්න බේකරිය අසලින් ඇති පඩිපෙළ වෙනුවට කොන්ක්‍රීට් යොදා පාර සකසා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ආර්.ලාල් නිශාන්ත මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 07**)

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මහතා ඔබගේ යෝජනාව මේ මහ ගරු සභාව වෙත ඉදිරි පත් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මහතා**

(ඉ) 8 .අප ප්‍රාදේශිය සභාවට අයත් හොරන්දල T.C. නිවාස වලට හා ප්‍රාදේශිය සභාවට අයත් ඉඩම් වල නිවාස සාදා පදිංචි වී සිටින අයට ඉඩම් ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ආර්.ලාල් නිශාන්ත මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 08**)

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මහතා ඔබගේ යෝජනාව මෙම මහ සභාව වෙත ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මහතා**

(ඉ) 09.ඓතිහාසික අමනාවල පත්තිනි දේවස්ථානයේ දේවගැතිතුමාගේ වත්මන් පාලනය නිසා එම දේවස්ථානයට පැමිණෙන බැතිමතුන් ඉතා දැඩි අපහසුතාවයට ලක්වනු දක්නට ලැබේ.මෙම දේවගැතිතුමා දිනපතා මත් ද්‍රව්‍ය පානය කිරීමෙන් දේව කටයුතු වල යෙදෙන බැවින් ,දේවාලය සදහා පැමිණෙන බැතිමතුන් හට මෙම ඓතිහාසික දේවාලය කෙරෙහි ඇති ගෞරවය නැතිවන ආකාරයට කටයුතු කරනු ලබයි.මෙම කරුණු නිසා දේවාලයට පැමිණෙන බැතිමතුන්ගේ සංඛ්‍යාවද අඩුවේ.මෙම තත්වය අප ප්‍රදේශයට මෙන්ම ජනතාවටද සතුටට කරුණක් නොවන අතර ,මෙම කරුණු සලකා බලා මෙම ඓතිහාසික දේවාලය යලි බැතිමතුන්ගේ ගෞරවයට පාත්‍ර වන ස්ථානයක් බවට පත් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා**

ගරු සභාපතිතුමනි,දේවගැතිතුමාට අවවාදාත්මක ලිපියක් නිකුත් කරන ලෙස දන්වා ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ප්‍රදේශයේ ජනතාවට කරන අසාධාරණයක් නිසා බදදා හා සෙනසුරාදා දින වලටවත් මත් ද්‍රව්‍ය පාවිච්චි නොකර පූජාව නියම ආකාරයෙන් පවත්වන ලෙස දන්වා අවවාද ලිපියක් නිකුත් කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 09**)

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මහතා ඔබගේ යෝජනාව මෙම මහ සභාව වෙත ඉදිරිපත් කරන්න

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මහතා**

(ඉ)10. පැලැම්පිටිය ,යටියන්තොට ප්‍රධාන මාර්ගයේ දැනට මාර්ග සංඥා පුවරු නොමැති කම නිසා අනතුරු සිදුවීම් ප්‍රවිණතාවය ඉහළ ගොස් ඇත.මෙම හේතුවෙන් සති අන්තයේ වී ඔය ,තෙප්පුකුලම් හා ඔිලු ඇල්ල යන සංචාරක ප්‍රදේශ වලින් පැමිණෙන සංචාරකයන් හා වාහන රියදුරන් රිය අනතුරු වලට මුහුණ දෙනුලබයි.

එමෙන්ම ප්‍රධාන මාර්ගයේ ප්‍රදේශය ආශ්‍රිතව ඇති පාසැල් වන සීපෝත්, බෙරන්නාව,අමනාවල,මලල්පොළ,නිව් පොළටගම යන ප්‍රධාන පාසැල් හා වී ඔය

විද්‍යාලෝක විද්‍යාලය යන පාසැල් ඉදිරි පිට පාර මාරු වන ස්ථාන වල" **සුදු ඉරි** " නොමැත.එමෙන්ම මාර්ග සංඥා පුවරුද නොමැත. ඉහත කරුණු අනුව පෙනී යන්නේ අප ප්‍රදේශයට ඉහත සදහන් කල අවශ්‍යතා ලබා දිය යුතු බවයි.ඒ සදහා අවශ්‍ය පියවර ගැනීම සදහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යංශය යටතේ පවතින මත්තමගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයට දැනුම් දෙන මෙන් මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

මේ සම්බන්ධව මත්තමගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයට ලිපියක් නිකුත් කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඩතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 10**)

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මහතා ඔබගේ යෝජනාව මෙම මහ සභාව වෙත ඉදිරිපත් කරන්න

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ ලසික සුනිල් දෙයියාගල මහතා**

(ඉ) 11.වැලිහෙලතැන්න වසමේ තැපැල් බෙදීම සිදුවන්නේ වසමේ හරි අඩකට පමණි.විකුම්සිරිගම ,රන්පවුම්ගම,මුගුණුවල යන ප්‍රදේශ වල ලිපි බෙදීම සිදු නොවන බැවින් ,ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇත.වැලිහෙලතැන්න වසමට තැපැල් කාර්යාලයක් ස්ථාපිතව පවතී.එම කාර්යාලයෙන් වීරගල්ල ,පොල්පිටිය,නෙලවතුකන්ද යන වසම්ද ආවරණය වේ.ඒ නිසා වැලිහෙලතැන්න වසමේ ලිපි බෙදන ගම්මාන සදහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකසා දෙන මෙන් මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මහතා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.එයට වැඩිමනක් වශයෙන් ප්‍රාදේශිය තැපැල් ස්ථානාධිපති හට තැපල් කරුවන් ලබා දෙන ලෙස ඉල්ලිමක් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මහතා**

ගරු සභාපතිතුමනි මේ ගැටළුව සෑම ප්‍රදේශයකම තිබෙන එකක්.හල්ගොල්ල වසමෙත් තැපැල් කාර්යාලයක් ඉදි කර තියෙනවා.නමුත් ඒක දැනට පාවිච්චියක් නෑ.මේ පිළිබදව වතු අධිකාරිතුමා හා තැපැල් ස්ථානාධිපතිතුමාට ලිපියක් මගින් දැනුම් දිමක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මහතා**

ගරු සභාපතිතුමනි,මේ පිළිබඳව ප්‍රාදේශිය තැපැල් ස්ථානාධිපතිට ලිපියකින් දැනුම් දිමක් කරන්න.

**ගරු සභාපතිතුමා**

මෙම ගැටළුව සම්බන්ධයෙන් ප්‍රාදේශිය තැපැල් ස්ථානාධිපතිට නව තැපැල් කරුවන් ලබා දෙන ලෙස ඉල්ලිමක් කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 11**)

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එන්.කේ නිමල් කුමාරසිරි මහතා ඔබගේ යෝජනාව මේ ගරු මහ සභාව වෙත ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එන්.කේ නිමල් කුමාරසිරි මහතා**

(ඉ) 12. මලල්පොළ ශෛලතලාරාම විහාරස්ථානයේ සූර්ය පැනල් සවිකර විදුලිය ලබා ගන්නා බවත් නමුත් විහාරස්ථානයේ විදුලිය නොමැති අවශ්‍ථා වලදී විදුලිය ලබා දීමට කටයුතු කරන ලෙස විදුලි බල ඇමති ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාගෙන් ඉල්ලා සිටින ලෙස මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩබ්ලිව්.කතිකා දමයන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා, සූර්යය පැනල් සවි කිරිම කියන්නේ විදුලිය ලබා දෙන එක නෙමෙයි.ඒ පන්සලේ විදුලිබි ල මේකෙන් ගෙවෙනවා.මෙමගින් පන්සලට අදායමක් එනවා.ලොකු හාමුදුරුවෝ මේ සම්බන්ධව දන්නවා.

**ගරු සභාපතිතුමා**

මේ සම්බන්ධව අපි සියළුම දෙනා අවබෝධයක් ලබා ගත්තා සූර්යය පැනල් සවි කිරිමෙන් කෙරෙන කාර්යය මොකක්ද කියලා.මම විශ්වාස කරනවා හැමදෙනාම මේක තේරුම්ගන්න ඇති කියලා.

**ගරු සභාපතිතුමා**

(ඉ) 13. යටි/පොදු වෙළදපොළ අංක 01 දරණ කඩ කාමරය අතුරු බදුගෙන ඇති T.රාමයියා මහතා විසින් එම කඩකාමරය ඔහුගේ නමට හරවා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.මුල් බදු කරු විසින්ද කැමැත්ත පළ කරමින් අවශ්‍ය ලියකියවිලි ලබා දී ඇත.

අංක 01 දරණ කඩකාමරය P.G. සිරිසේන නමින් ලෙඛනගතව ඇත.නමුත් ලිපි ගොනුවේ ඔහු විසින් අත්සන් කරන ලද මුල් බදු ගිවිසුම නොමැති අතර ලේඛනාගාරයේද ඊට අදාල ලිපි ලේඛන හෝ ගිවිසුමේ පිටපත සොයා ගැනීමට නොහැක.සිරිසේන මහතාගෙන්ද ඒ පිළිබදව විමසුවද ඔහු සතුවද ගිවිසුමේ පිටපතක් නොමැති බවට ප්‍රකාශ කර ඇත.

- කඩ කාමර සම්බන්ද පොදු ගොනුවේ අංක 108 පිටු අංකයේ ඇති 2004/06/11 දිනැති වාර්ථාව මගින්ද අංක 01 දරණ කඩකාමරය P.G.සිරිසේන නමින් බදු ගිවිසුම් අත්සන් කර ඇති බවට වාර්ථා වී ඇත.
- 2010/11/23 දිනැති තක්සේරු වාර්ථාවේද අංක 01 කඩකාමරය සදහා බදු කරු ලෙස P.G. සිරිසේන නම සදහන්ව ඇත.
  ප.පා.කො. චක්‍රලේඛ 2019/01 හි 1-11 වගන්තියට අනුව කඩ කාමරයක් අතුරු බදු දී ඇති අවශ්‍ථාවකදී එය ආපසු සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන අවශ්‍ථාවකදී මුල් කීමනි මුදලින් 25% අයකරගෙන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අතුරු බදු කරුට පැවරිය හැක.

| අතුරු බදු කරුට පවරන්නේ නම් අය කර ගත හැකි කී මනි මුදල | කඩකාමරය පවරාගෙන නැවත ටෙන්ඩර් කරන්නේ නම් ලැබෙන ආදායම |
|---|---|
| මුල් වටිනාකම =රු 88000.00<br>ඉන් 25% =රු 22000.00 | මාසික කුලිය =රු 8 750<br>කී මනි මුදල = 8750*12=105000*10<br>(අවට ලංසුව) = 1 050 000.00 |

ඉහත කඩකාමරය පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීම හෝ අතුරු බදු කරුට පැවරීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීමට ගරු මහා සභාවට මා ඉදිරිපත් කරමි.

*මේවන විට තවත් අතුරු බදු කරුවන් දෙදෙනෙක්ගේ නම් යෝජනාවෙලා තියෙනවා.

1.බාල ක්‍රිෂ්ණන් ශ්‍රිධරන් මහතා යටියන්තොට පොදු වෙළදපල අංක 12 කඩ කාමරය අතුරු බදු ගෙන ඇති අතර මුල් බදු කරු වන කේ.ඒ.ප්‍රේමසිංහ මහතා ද එම කඩ කාමරය ඔහුට පවරා දිමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

2.යටියන්තොට පොදුවෙලදපල අංක 08 දරණ කඩ කාමරයේ බදු කරු වන එම්.ටි.එම්.අන්වර් මහතා මිය ගොස් ඇති බැවින් එම කඩ කාමරයේ අතුරුබදු කරු වන කේ.ජී.රූපසිංහ මහතාට පැවරීම සම්බ්ධයෙන් මහ සභාවේ තිරණයක් ලබා ගැනිම සදහා මා යෝජනා කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඒ.එල්.සුනිල් දෙයියාගල මහතා

ගරු සභාපතිතුමනි,මා එම යෝජනාව ස්ථිර කරනවා.මෙම කඩ කාමර ටෙන්ඩර් කළොත් අපට විශාල මුදලක් ලැබෙනවා.එම නිසා අතුරු බදු කරු හට පැවරිමේ දි රුපියල් ලක්ෂයක් ඇප තැන්පත් වශයෙන් තබා ගැනිම සඳහා ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවිමට සුදුසු යැයි මා දන්වා සිටිනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මහතා

ගරු සභාපතිතුමනි මමත් එම යෝජනාවට එකග වෙනවා.චක්‍රලේඛ අනුවනම් 25%ක මුදලක් ලබා ගැනිම සඳහා සඳහන්ව ඇත.නමුත් මේ වන විට එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් අතුරු බදු කරුහට පැවරීමේ දි ලක්ෂයක ඇප තැන්පත් ලබා ගන්න කියා මා ප්‍රකාශ කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.ජී.තිලකරත්න මහතා

ගරු සභාපතිතුමනි මමත් එම අදහසට එකග වෙනවා.

## ගරු සභාපතිතුමා

1986 මෙම කඩ කාමර බදු දිලා තියෙනවා.එවකට බදු දුන් මුදලෙන් 25% ලබා ගත්තොත් අපට ලැබෙන්නේ ඉතාම සුළු මුදලක්.අංක **01,08,12** යන කඩ කාමර ටෙණ්ඩර් කලොත් අප සභාවට විශාල ආදායමක් ලැබෙනවා.එම නිසා අතුරු බදු කරුවන්ට පැවරීමේ දි රුපියල් ලක්ෂයක් ඇප තැන්පත් වශයෙන් තැන්පත් කිරිමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනිම සඳහා යැවිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 13**)

## ගරු සභාපතිතුමා

(ඉ) 14.යටියන්තොට පොදු වෙළඳපල අංක 02 දරණ කඩ කාමරයේ බදු කරු වන නඩේෂන් ජයරාම් මහතා මිය ගොස් ඇති බැවින් ඔහුගේ බිරිද වන සෙල්වරාජ් කමලාවති යන අයට පැවරිම සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

## ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.සුමනතිස්ස ජයතිලක මහතා

සභාපතිතුමනි මම ඒ යෝජනාව ස්ථිර කරනවා.එයට වැඩිමනක් වශයෙන් මෙම කඩ කාමරය ස්වාමිය මිය ගිය පසු බිරිඳට පැවරීමේ ක්‍රම වේදයක ඇති බැවින් එය අනුගමනය කරමින් පැවරිම සිදු කරන ලෙස මා දන්වා සිටිනවා.

## ගරු සභාපතිතුමා

අංක 02 කඩ කාමරය මිය නඩේසන් මහතා වෙනුවට ඔහුගේ බිරිදට පැවරිමට ගරු ආණ්ඩුකාර තුමියගේ අනුමැතියට යැවිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 14)**

**ගරු සභාපතිතුමා**

(ඉ) 15.writ /150/2018 නඩු අංකය යටතේ අභියාචනාධිකරණයේ පවරා ඇති ගල්පාත කන්දේවත්ත පාර නඩුව සඳහා ෆොක්සි සකස් කිරීම හා උපදේශන සේවා වෙනුවෙන් නීතිඥ (ජනාධිපති) රොහාන් සහබන්ධු මහතා රු.250000ක් සහ රු 52000 ක් වන පරිදි රු.302000ක බිල්පතක් ඉදිරිපත් කර ඇත.මෙම බිල්පත පියවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 15)**

**ගරු සභාපතිතුමා**

(ඉ) 16.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් ZA 5057 දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රයේ ඉදිරිපස රෝදයේ හබ් රේසරය හා යාකරනා කොටස්වල ඇති වූ දෝෂයක් හේතුවෙන් ධාවනයට නුසුදුසු තත්වයක පවති.එම යන්ත්‍රය නියෝජිත ආයතනය වන ඇවෝන්ස් මාන්ස් ඇයතනය මගින් කොටස් යොදා අළුත්වැඩියා කිරීමටත් එම ආයතනය මගින් සේවා කටයුතු සිදු කිරීමත් සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 16)**

**ගරු සභාපතිතුමා**

(ඉ) 17.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් සියළුම වාහාන මෙතෙක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් රක්ෂණාවරනය කරන ලදි.මින් ඉදිරියට අර්ධ රාජ්‍යක් වන ශ්‍රී ලංකා රක්ෂන භාර අරමුදලින් රක්ෂණය කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු උප සභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 17**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 18.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් වාහාන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018.07.01 සිට 2018.07.31 වන දින දක්වා ඉන්ධන හා ලිහිසි තෙල් ලබා ගැනිම වෙනුවෙන් යටියන්තොට විවිධසේවා සමූපකාර සමිතිය මගින් රු.228249.90 ක් වටිනා බිල්පතක් ඉදිරිපත් කර ඇත.එම බිල්පත ගෙවිම් කිරිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු උප සභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 18**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 19.යටියන්තොට ප්‍රාදේශිය සභාවට අයත් කැනපි හට් වල ආවරණය දිරාපත් වි ඇති බැවින් කැනපි ආවරණ 05ක් මිලදී ගැනිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 19**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 20.යටියන්තොට ප්‍රාදේශිය සභාව වෙතින් පවත්වනු ලබන උත්සව අවස්ථාවලදි විවිධ පාට වලින් පතාක කොඩි අවශ්‍ය වි ඇත.ඒ සඳහා පතාක කොඩි 50 ක් මිලදි ගැනිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා කුමාරි මෙනවිය**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 20**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 21.2017 වර්ෂයේ සබරගමු පළාත් සභාවෙහි කෘෂි අමාත්‍යංශය මගින් ප්‍රතිපාදන වෙන් කරන ලද පහත සඳහන් ව්‍යාපෘතිවල 10% රැඳවුම් මුදල ගෙවිම් කිරිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

2017 වර්ෂය සංවර්ධන ව්‍යාපෘති -රැදවුම් මුදල් ගෙවීම

| අනු අං | ව්‍යාපෘතිය | කොන්ත්‍රාත්කරු | 10% මුදල (රු) |
|---|---|---|---|
| 01 | වරකාගොඩ තැන්න කෘෂි මාර්ගය සංවර්ධනයට කිරීම | වරකාගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය | 29,086.41 |

| | | | |
|---|---|---|---|
| 02 | බදුල්ලවලකැබැල්ලවනාව කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | ඉංගිරියාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | 28,905.61 |
| 03 | අමනාවල දේවාලය අසලින් බරුහේන කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | ජයවින්දාගම ගොවි සමිතිය | 29,022.40 |
| 04 | සීපෝත් නව ගම්මාන කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | සීපෝත් ගොවි සංවිධානය | 28,100.62 |
| 05 | සීපෝත් කොට්ටමලේ කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | සීපෝත් ගොවි සංවිධානය | 29,137.98 |
| 06 | කබුළුමුල්ල විද්‍යාලය අසලින් කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | මීපිටිකන්ද වත්ත පාර | 29,086.41 |
| 07 | පරුස්සැල්ල ඩී.එම්ද සිලිවා මාවත කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | ජයවින්දාගම ගොවි සමිතිය | 28,980.17 |
| 08 | බදුල්ලවල තලගහකන්ද කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | පොලටගම ග්‍රාම සංවර්ධන සමිතිය | 24,305.15 |
| 09 | මත්තමගොඩ තලෝවිට සිට ඉහළ ගම්මැද්ද පරගහවැල්ල කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | මත්තමගොඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය | 24,167.15 |
| 10 | මත්තමගොඩ එපිටගම්මැද්ද කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | මත්තමගොඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය | 24,167.15 |
| 11 | මත්තමගොඩ නිළමෙගම්මැද්ද කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | මත්තමගොඩ කෘසි කාර්මික හා ඵලදායීතා වර්ධන ගොවි සංවිධානය | 24,155.14 |
| 12 | බෙරන්නාව පල්ලේකුඹුර සිට වරකාතැන්න කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | අරුණ ගොවි සංවිධානය | 22,882.86 |
| 13 | ජයතුකන්ද කෘසි මාර්ගය පඩිපෙළ කානුව හා පැති බැම් බැඳීම | ගෝනගමුව ගොවි සංවිධානය | 27,383.80 |
| 14 | වීරගල්ල පහළ කොටස කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | ඉහළ ගරාගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය | 23,358.93 |
| 15 | තැලිගම බටහේන කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | ගෝනගමුව ගොවි සංවිධානය | 29098.25 |
| 16 | දූුණුකේදෙනිය තෙබුගහවත්ත හරහා ගොන්නාන කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | කිරිකොහුතැන්න සුළු ගොවි සංවිධානය | 24,283.05 |
| 17 | පොල්පිටිය පුස්වැලහින්න කෘෂි මාර්ගය | පොල්පිටිය ග්‍රාම සංවර්ධන | 23,503.5 |

| | | | |
|---|---|---|---|
| | කොන්ක්‍රීට් කිරීම | සමිතිය | 6 |
| 18 | කිරිකොහුතැන්න ගලපල්ලවත්ත කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | කිරිකොහුතැන්න සුළු ගොවි සංවිධානය | 29,156.16 |
| 19 | පාරාවත්ත පැරණි ජනපදය කොරහවත්ත කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | මත්තමගොඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය | 24,324.58 |
| 20 | ගනේපල්ල පොල්කොටුව කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | ගනේපල්ල ග්‍රාම සංවර්ධන සමිතිය | 24,324.58 |
| 21 | පැලැල්ලේගම විමුක්තිපුර කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | පොලටගම ග්‍රාම සංවර්ධන සමිතිය | 24,324.58 |
| 22 | දෙනවකවත්ත බිලිංගහකොටුව කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | ජයවින්දාගම ග්‍රාමීය සමෘද්ධි බලකාය | 24,313.22 |
| 23 | ගනේපල්ල ජනපදය කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | ගනේපල්ල ග්‍රාම සංවර්ධන සමිතිය | 24,313.22 |
| 24 | ගල්ගේ ලැයිම කෘසි මාර්ගය සංවර්දනය කිරීම | වරකාගොඩ ග ග්‍රාම සංවර්ධන සමිතිය | 29099.32 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 21**)

**ගරු සභාපතිතුමා**

**(ඉ) 22.2018** වර්ෂයේ සබරගමු පළාත් සභාවෙහි සමාජ සුභසාධන පරිවාස හා ළමා රක්ෂණ අධිකාරිය මගින් අනුමත ව ක්‍රියාත්මක කරන ලද වැල්ගාල තෙඹුගහහින්න මාර්ගය කොන්ක්‍රිට් කිරීම ව්‍යාපෘතිය ඉටු කරන ලද ව්‍යාපෘතියෙහි බිල්පත් වටිනාකම රු.487885.92 කි.අදාල මුදල් ලැබුණු පසු ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා කුමාරි මෙනවිය**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 22**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.2019 වර්ෂය සඳහා බදු පැනවිමේ යෝජනාව මහ සභාවේ තීරණ ලබා ගැනිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා කුමාරි මෙනවිය**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

2019 වර්ෂයේ බදු පැනවිම සඳහා ඉංග්‍රිසි,දෙමළ, සිංහල යන භාෂා තුනෙන්ම ගැසට් පත්‍රයේ පළ කිරිම සඳහා යැවිමත් සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක 23**)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.i.2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**වරිපනම් බදු 2019 -වර්ෂය**

<u>යෝජනාව.</u>

) වන වගන්තියේ 146 දේශීය සභා පනතේදරණ ප්‍රා 15 අංක 19871වන උප ( කාර යටියන්තොට දේශීය සභාවලට පැවරී ඇති බල තල ප්‍රවගන්තියෙන් ප්‍රා දේශය තුල පිහිටි සියලුම නිවාසවලදේශීය සභා බල ප්‍රප්‍රා,ගොඩනැගිලිවල ,ඉඩම්වල හා ගෙපත්වල 2019 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම් 2011 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ ) වන වගන්තියේ 1341වන උප ( දේශීය ලේකම් කාර යටියන්තොට ප්‍රාවගන්තියෙන් ලැබී ඇති බල තල ප්‍ර කොට්ඨාශයේ

ම නිලධාරී කොට්ඨාශයේ පිහිටි දියුණු කල යටියන්තොට ග්‍රා 106 අංක (අ) දේශයේ සෑම නිශ්චිත දේපලක වාර්ෂප්‍රික වටිනාකමෙන් සියයට දා හතරක )14ක වරිපනමක්ද(%,

ම නිලධාරී කොට්ඨාශයේ පිහිටි දියුණු කිතුල්ගල උතුර යන ග්‍රා 134 අංක (ආ) දේශයේ සෑම නිශ්චිත දේපලක වාර්ෂික වටිනාකමෙන් සියයට දහයකකල ප්‍ර ) 10ක වරිපනමක්ද(%,

යටියන්තොට 106 අංක (ඇ),අංක ඒ පරුස්සැල්ල 106,අංක සී 15පහල ගරාගොඩ ,ම නිලධාරී බී කබුලුමුල්ල යන ග්‍රා 106 ඩී ඉහල ගරාගොඩ හා 115 දේශයේ සෑම නිශ්චිත දේපලක වාර්ෂික කොට්ඨාශයේ පිහිටි දියුණු කල ප්‍ර ) වටිනාකමෙන් සියයට නමයක09ක වරිපනමක්ද(%,

වර්ෂය සදහා පනවා අය කිරීමටත් සහ 2019

ඒ වරිපනම් ,එකී ප්‍රාදේශීය සභා පනතේ වන වගන 134්තියේ )6වන උප ( 31 වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු,ජුනි 30,සැප්තැම්බර් 30,හා දෙසැම්බර් යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන 31 දේශීය සභාව වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් යටියන්තොට ප්‍රා .යෝජනා කරන්නීය

## වරිපනම් බදු -2019 වර්ෂය සදහා

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සදහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2019 ජනවාරි සිට 01 දක්වා 31 මාර්තු | 2019 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2019 අප්‍රේල් සිට ජුනි 01 දක්වා 30 | 2019 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2019 ජුලි සිට 01 දක්වා 30 සැප්තැම්බර් | 2019 ජුලි 31 |
| හතරවන කාර්තුව | 2019 ඔක්තෝබර් 01 31 සිට දෙසැම්බර් දක්වා | 2019 ඔක්තොබර් 31 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.පි.ජී.ඩබ්ලිව්.කිර්තිසේන අල්විස් මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක** 23.i.)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.ii.2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>අක්කර බදු . වර්ෂය 2019</u>**

**<u>යෝජනාව</u>**

) වන වගන්තියේ 134 දේශීය සභා පනතේදරණ ප්‍රා 15 අංක 19873වන උප ( කාර යටියන්තොට දේශීය සභාවට පැවරී ඇති බල තල ප්‍රවගන්තියෙන් ප්‍රා වන 135දේශය තුල පිහිටියා වූ ද ඉහත කී පනතේදේශීය සභා බල ප්‍රප්‍රා වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද ස්ප්‍ර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ,එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනු ප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක්,

) වන වගන්තියේ 134 ඉහත කී පනතේ (අ)3වැනි උප වගන්තියේ අතුරු ( තුමා විසින් විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය දේශය විදේශීය සභා බල ප්‍රයටියන්තොට ප්‍රාශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ iv1989 වැනි කොටසේ (ආ) .03. 10 කාශයට පත් කර ඇති හෙයින්යේ ප්‍රදිනැති ගැසට් පත්‍ර,හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත වර්ෂය සඳහා 2019 .රු50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ ,

හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ (ආ) . වර්ෂය සඳහා රු 2019 සෑම හෙක්ටයාරයක්ම මත10.00 බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමටත්,

) වන වගන්තියේ 134 දේශීය සභා පනතේප්‍රා (ඇ)6වෙන උප වගන්තියේ විධි ( විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31,ජුනි 30,සැප්තැම්බර් හා දෙසැම්බර් 30 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කල යුතු 31 .දේශීය සභාව යෝජනා කරන්නීයයැයිද යටියන්තොට ප්‍රා

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සදහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු වන කාර්තුව | සිට 01 ජනවාරි 2019 දක්වා 31 මාර්තු | 31 ජනවාරි 2019 |
| දෙවන කාර්තුව | සිට ජුනි 01 ල්අප්‍රේ 2019 දක්වා 30 | 30 ල්අප්‍රේ 2019 |
| තුන්වන කාර්තුව | සිට 01 ජුලි 2019 දක්වා 30 සැප්තැම්බර් | 31 ජුලි 2019 |
| හතරවන කාර්තුව | 01 ඔක්තෝබර් 2019 | 31 ඔක්තොබර් 2019 |

| | | |
|---|---|---|
| | 31 සිට දෙසැම්බර් දක්වා | |

**ගරු උපසභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක**23.ii)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.iii.2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**කර්මාන්ත බදු 2019 -වර්ෂය**

යෝජනාව

) වන වගන්තියේ 150 දේශීය සභා පනතේදරණ ප්‍රා 15 අංක 19871වන උප ( කාර යටියන්තොට දේශීය සභාවට පැවරී ඇති බල තල ප්‍රවගන්තියෙන් ප්‍රා 1 දේශය තුල කර ගෙන යනු ලබන පහත උපලේඛනයේදේශීය සභා බල ප්‍රප්‍රා 11 වන තීරුවේ සදහන් එක් එක් කර්මාන්කය වෙනුවෙන් එම උපලේඛනයේ වන තීරුවේඑ් එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් වර්ෂය සදහා පනවා අය කල යුතු බවටත් 2019,එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු දේශීය වන දිනට පෙර යටියන්තොට ප්‍රා 30 වර්ෂයේ මාර්තු 2019 සභාවට ගෙවිය යුතු බවටත් යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය .

| | | | | |
|---|---|---|---|---|
| | වන තීරුව 1 | වන 11 | තීරුව | |
| | කර්මාන්ත | පරිශ්‍රෙය හි | වටිනාක ම | |
| | | රු.750.00 නොඉක් මවන | රු.750 ඉක්මවන . පඑහෙක් .රු1500 නොඉක් මවන අවස්ථා | ර.1500.0 0ඉකිමව න අවස්ථා |
| 01 | ඇදුම් මැසීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 02 | කුෂන් වැඩපලත් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | ස්වර්ණාභරණ නිෂ්පාදන කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 04 | විදුරු අල්මාරි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 05 | හඳුන්කූරු නිෂ්පාදන ය | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කෘතිම මල් සෑදීම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 08 | ගඩොල් නිෂ්පාදන කිරීමේ ස්ථානයත් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | මිනිරන් පතලක් පවත්වාගෙන යාම හා තලාතු මිනිරන් සකස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | වඩුකර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12 | තීන්ත වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 13 | සම් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 14 | යකඩ පුටු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 15 | තේ කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 16 | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම . | 500.00 | 750.00 | 1000.00 |
| 17 | කොහු මෝලක් පවත්වා ගෙන යාම-. 1 අශ්ව බල-දක්වා 10 | 500.00 | 750.00 | 1000.00 |
| 18 | යන්ත්‍ර නොමැතිව පාවහන් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 19 | වේවැල් ,පුටු නිපදවීමේ ,ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 20 | අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 21 | ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඩතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක**23.iii)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.iv.2019 වර්ෂය සඳහා සතිපොළ ගාස්තු පැනවිම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**සතිපොල ගාස්තු අය කිරීම -2019 වර්ෂය**

## යෝජනාව

යටියන්තොට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ සතිපොලවල් වලින් පහත සදහන් ආකාරයට වර්ෂය සදහා ගාස්තු අය කිරීමට යටියන්තොට 2019 ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

1.අඩි 8X.රු= කාමරයක් සදහා 6 200.00
2. අඩි 6X 8 කාමරයක් සදහා .රු=200.00
3. අඩි 6X.රු= කාමරයක් සදහා 6 140.00
4. අඩි 5 X5 කාමරයක් සදහා .රු=100.00
5.පදික තාවකාලික .රු=80.00
6.පදික එලිමහන් - .රු= 60.00

කිතුල්ගල සතිපොල ගාස්තු අය කිරීම.

1.අඩි 10X.රු = කාමරයක් සදහා 8 140.00
2. .අඩි 10X.රු = කාමරයක් සදහා 6 100.00
3. පදික තාවකාලික .රු= 60.00
4.පොල භූමිය තුල මාර්ගය දෙපස වෙළෙන්දකුගෙන් .රු =60.00

**ගරු උපසභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා**

ගරු සභාපතිතුමනී.ඒ යෝජනාව මා ස්ථිර කරනවා.සති පොළේ ගාස්තු අය කිරිම

1.අඩි 8X.රු= කාමරයක් සදහා 6 250.00
2. අඩි 6X 8 කාමරයක් සදහා .රු=250.00
3. අඩි 6X.රු= කාමරයක් සදහා 6 200.00
4. අඩි 5 X5 කාමරයක් සදහා .රු=150.00
5.පදික තාවකාලික .රු=100.00
.6.පදික එලිමහන් -ගැසට් නොකර සිටිමටත් එම වෙළදුන් සති පොළ භූමිය තුළට රැගෙන ඒමටත්,

කිතුල්ගල සතිපොල ගාස්තු අය කිරීම.
1.අඩි 10X.රු = කාමරයක් සදහා 8 200.00
2. .අඩි 10X.රු = කාමරයක් සදහා 6 150.00
3. පදික තාවකාලික .රු= 100.00
.4පොල භූමිය තුල මාර්ගය දෙපස වෙළෙන්දකුගෙන් .රු =10000. සදහා සුදුසු යැයි මා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.සත්‍යානන්දන් මහතා**

ගරු උප සභාපතිතුමාගේ අදහසට මා එකග වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද සතිපොළ ගාස්තු අය කිරිමේ සංශෝධන සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම අදහස් දැක්විමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක**23.iv.)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.v.2019 වර්ෂය ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසරය සඳහා ගාස්තු පැනවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

ප්‍රචාරක දැන්වීම් වර්ෂය සදහා 2019 පරිසරයදෘෂ්‍ය-

යෝජනාව

1952 අංක ස්ථා පනතේ විධි දරණ පලාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යා 06 1988 වරයා විසින්කාරව විෂය භාර අමාත්‍යවිධාන ප්‍ර.8.520 දිනැති අංක 23/ 7 දරණivකාශයට යේ ප්‍රවැනි කොටස පලාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍ර (ආ) පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2012/01/වන අතුරු 39 දිනැති වැළද ගැනීමට කටයුතු කර ඇති අතර එකී 13 දේශීය සභා සීමාව තුළ කාර යටියන්තොට ප්‍රාවස්ථාවේ විධි විධාන ප්‍රව්‍ය දර්ශනය කිරීම් වෙනුවෙචාරක දැන්වීම් ඉදිකිරීම් හා ප්‍රප්‍රන් වර්ෂය සදහා 2019 .ක් සදහා රු 01 තාවකාලික බැනර් හා දැන්වීම් පුවරු වර්ග අඩි25 ක් ද ,ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩි .ක් සදහා රු 0150 ක්ද අය කිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

**1.**තාවකාලික බැනර්,කටවුට් හා දැන්වීම් පුවරු සදහා වර්ග අඩියකට රු.25.00
2.ස්ථිර දැන්වීම් පුවරු සදහා වර්ග අඩියකට රු.50.00

**ගරු උපසභාපතිතුමා ඒ.වි.රොහාන්ත ගුණසේකර මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්විමක් ,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

(**සභා තීරණ අංක**23. v)

**ගරු සභාපතිතුමා**

(ඉ) 23.vi.2019 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

වෙළද බලපත්‍ර ගාස්තු . වර්ෂය 2019

# යෝජනාව.

1952 අංක ස්ථා පනතේ විධි දරණ පලාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යා 06 විධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් 1988.8.කාශයට පත් පත් දිනැති ප්‍ර 23 2012 වස්ථාවකර ඇති සම්මත අතුරු ව්‍ය/01/520 දිනැති අංක 13/ දරණ 7ivවැනි (ආ) වස්ථාව වන වන අතුරු ව්‍ය 21 ය්කොටස පලාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රෙ සන්න හා අන්තරාදායක වෙළදාමට අදාල උපලේඛන සමග වැළදගැනීමට අප්‍ර දේශීය සභාව කටයුතු කර ඇති අතර එකි උපලේඛනයේ සදහන් යටියන්තොට ප්‍රා 11 වස්ථාවේක් හා එකී සම්මත අතුරු ව්‍ය 35 කර්මාන්ත/ පාරව්‍යා,14-17,19,20,22,23,27-කාරව වෙළද වස්ථා වල විධි විධාන ප්‍රඅංක දරණ අතුරු ව්‍ය 29 දේශීය ක් සදහා යටියන්තොට ප්‍රා 15 කර්මාන්ත/පාර ලබාගෙන යුතු ව්‍යාබලපත්‍ර 1987 සම්බන්ධයෙන්වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර 2019 සභාව විසින් 147 දේශීය සභා පනතේදරණ ප්‍රා 15 අංක වන වගන්තිය සමග කියවිය යුතු වන 149 1 කාර පහත උපලේඛනයේදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රවගන්තියෙන් ප්‍රා වන 11 වන තීරුවේ සදහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ ගාස්තුවක් පනවා අය මාණයක බලපත්‍රතීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍ර දේශකිරීමට යටියන්තොට ප්‍රාීය සභාව යෝජනා කරන්නීය .

| | වන තීරුව 1 | වන 11 | තීරුව | |
|---|---|---|---|---|
| | බලය දෙනු ලබන කාර්යය | පර්ශ්‍රෙ යහි | වාර්ෂික | වටිනාක ම |
| | | රු.750 නොඉ. ක්මවන අවස්ථා ව | රු.750 නොඉක් මවන එහෙත් රු.1500 නොඉක් මවන අවස්ථා ව | රු.1500 ඉක්මවන . අවස්ථාව |
| 01 | රේඩියෝ අලුත්වැඩියා කිරීමෙි ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 02 | තීන්ත වාර්නිෂ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 03 | තලාතු මිනිරන් වේලිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | තෙල් මෝලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 05 | යන්ත්‍රානුසාරයෙන් ඇට කටු ඇඹරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | අම්ලකර පැස්සීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 07 | මෝටර් වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 08 | ඇලුමිනියම් නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 09 | සිමෙන්ති පමණක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 10 | මෙතිලේඩ් ස්ප්‍රීතු නිපදවීමේ හෝ ගබඩා කිරීමේ | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ස්ථානයක් පවත්වා ගෙන යාම. | | | |
| 11 | අලුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ටිං කෑම,කිරි ආහාර වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 13 | ඇසිට්වර්ග නිපදවීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 14 | ගිනිකෙලි භාණ්ඩ ,රතිඤ්ඤා විකිණීම සදහා ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 15 | කන්ටේනර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 16 | මදුරු කොවිල් නිෂ්පාදන කරන කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 17 | විද්‍යුත් ලෝහාලේපන කිරීම හෝ රෝමියම් ලෝහාලේපන හෝ රන් රිදී ලෝහාලේපන කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 18 | යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් ටියුබ් අලුත්වැඩියා කිරිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ලියුම් කවර නිෂ්පාදන කරන ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 20 | පොල් පරාල සකස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 21 | මෝටර් රථ විදුලි උපකරන අලුත්වැඩියාව. | 500.00 | 750.00 | 1000.00 |
| 22 | ඔරලෝසු අලුත් වැඩියා ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 23 | දැන්වීම් පුවරු සකස් කිරිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 24 | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 25 | අශ්ව බල 5-අතර වී මෝලක් ඇඹරුම්හලක් 20 .පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | අශ්ව බල ටඅධික වී මෝලක් ඇඹරුම්හලක් 20 .පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 28 | හුණු පිලිස්සීමේි හා වේලිමේ හා රැස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 29 | මෝටර් වාහන සදහා බොඩි සාදන ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 30 | ලියවන පට්ටල් භාවිතා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 31 | මැණික් කපා ඔපදමන ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 32 | ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 33 | ගෑස් නිපදවීමේ හා පිරවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 34 | දැව ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 35 | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 36 | ලැගුම් නිවාස | 500.00 | 750.00 | 1000.00 |
| 37 | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 38 | බත් කඩ ආපන ශාලා හා තේ කෝපි කඩ | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 39 | බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 40 | කිරි පට්ටි හා කිරි වෙළදාම | 500.00 | 750.00 | 1000.00 |
| 41 | මාලු විකිණිම | 500.00 | 750.00 | 1000.00 |
| 42 | මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 43 | අයිස් කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 44 | සිසිල් බීම කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 45 | ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 46 | ගව ගාල් | 500.00 | 750.00 | 1000.00 |
| 47 | සංචාරක වෙළදාම | 500.00 | 750.00 | 1000.00 |
| 48 | පෞද්ගලික වෙළදපොලවල් සහ වෙනක් බලයලත් ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 49 | කොණ්ඩා සැකසීමේ සැලූන්හල් බාබර් සාප්පු | 500.00 | 750.00 | 1000.00 |
| 50 | විදුලි ආරෝපන මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මහතා**

එම යොජනාව මා විසින් ස්ථිර කරනවා.

